# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 21

# දරන මිල පාලන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 මැයි මස 9 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1975 මැයි මස 23 වැනි දින ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදි)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබා ගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 21 දරන මිල පාලන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 මැයි මස 9 වන දින]

එල්. ඩී.—ඕ. 13/74.

**මිල පාලන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 21 දරන මිල පාලන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

**2.** 1962 අංක 23 දරන පනතින් සංශෝධිත මිල පාලන පනතෙහි 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— *173 වන අධිකාරයේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) ඒ භාණ්ඩය නොවිකිණිය යුත්තේ (කර්මාන්ත ශාලාවේ දී, තොග සහ සිල්ලර) යම් උපරිම මිලකට වැඩියෙන් ද ඒ මිල නියම කිරීම ;" ;

(2) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට එහි (ඇ) ඡේදය වශයෙන් නැවත අක්ෂර යෙදීමෙන් ; සහ

(3) ඒ උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ආ) (i) නිෂ්පාදක විසින් හෝ ආනයනකරු විසින් ඒ භාණ්ඩයේ (කර්මාන්ත ශාලාවේ දී, තොග සහ සිල්ලර) උපරිම මිල නියම කළ යුත්තේ යම් මිල ව්‍යුහයකට අනුව ද ඒ මිල ව්‍යුහය දක්වීම ;

(ii) එසේ නියම කරනු ලැබූ උපරිම මිල ඒ නිෂ්පාදක විසින් හෝ ආනයනකරු විසින් මහජනයාට දැන ගැනීමට සැලැස්විය යුතු ආකාරය දැක්වීම ; සහ

(iii) ඒ භාණ්ඩය යම් උපරිම මිලකට වැඩියෙන් නොවිකිණිය යුත්තේ ද ඒ උපරිම මිල එසේ නියම කරනු ලැබූ මිල විය යුතු බව නියම කර දැක්වීම : සහ".

2—ඒ 13038—11,818 (75/08)